**පොල් පර්යේෂණ මණ්ඩලය - 2020**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

පොල් පර්යේෂණ මණ්ඩලයේ2020දෙසැම්බර්31 දිනටමූල්‍යතත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේමූල්‍ය ප්‍රකාශන තුළින්2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝඅභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේකාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 76 ඡේදය ප්‍රකාරව ජංගම නොවන ලෙස දැක්විය යුතු වසර 05 ක කාලයකට 2017 මැයි 16 දින ස්වයංක්‍රියව අලුත් කිරීමේ පදනමින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු.42,600,000 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු සමුච්චිත පොලිය රු.21,092,340 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2021වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදිව ඉදිරිපත් කරන බව දන්වමි. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| **(ආ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 08 ඡේදයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය යුතු මධ්‍යස්ථාන 3 ක ඇති සුළු මුදල් රු.153,780 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දී අනෙකුත් ජංගම වත්කම් යටතේ ද දක්වා තිබුණි. | 2021වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව සුළු මුදල් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය කළ යුතුය. |
| **(ඇ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව වත්කම්වල ස්වභාවය හා ක්‍රියාකාරිත්වය මත පදනම්ව ඒවායේ ඵලදායී ජීවිත කාලය ගණනය කර ක්ෂය කිරීම කළ යුතු වුවත්, එකිනෙකට වෙනස් ඵලදායී ජීවිත කාලයන් සහිත රු.3,651,845 ක් වටිනා ලී බඩු හා | භාණ්ඩ හා සේවා සඳහා එම වර්ෂයේ අයවැය වාර්තාවෙහි ඇතුළත් එක් එක් වැය සංකේතය වෙනුවෙන් ලබා දී ඇති ප්‍රතිපාදන පදනම් කර ගනිමින් ගෙවීම් කිරීම නිසා මෙලෙස ඇතැම් වත්කම් ඊට අදාළ කාණ්ඩයෙන් බැහැරව වෙනත් වත්කම් කාණ්ඩයක් යටතේ | ප්‍රමිති අංක 07 ප්‍රකාරව වත්කම්වල ස්වභාවය හා ක්‍රියාකාරිත්වය මත පදනම්ව ඒවායේ ඵලදායී ජීවිත කාලය ගණනය කර ක්ෂය කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.749,000 ක් වටිනා වාහන එක් වත්කම් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය කර ක්ෂය කිරීම් සිදු කර තිබුණි. | වර්ගීකරණය වී ඇත. මෙම දෝෂය ඉදිරියේදී සිදු නොවීමටත්, දැනටමත් ඇතුළත් කර ඇති වත්කම් නිවැරදිව ගැලපීමටත් කටයුතු කරන බව දන්වමි. | |
| **(ඇ)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 15 හි 29 ඡේදය ප්‍රකාරව ඉදිකරමින් පවතින ගොඩනැගිලි 02 ක කෙරීගෙනයන වැඩ සඳහා මුදලින් ගෙවා ඇති රු.351,832 ක් වෙනුවට ප්‍රදානය කළ මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.4,678,772 ක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂය තුළ කෙරීගෙන යන වැඩ ගිණුමේ හා ගෙවිය යුතු වියදම් ගිණුමේ ශේෂයන් රු.4,326,940 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | මුදලින් ගෙවන ලද ප්‍රමාණයටවැඩියෙන් කෙරීගෙන යන වැඩ ගිණුමට ඇතුළත් කර ඇති මුළු කොන්ත්‍රාත් වටිනාකම් ඉවත් කර 2021වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රමිතිය අනුව කොන්ත්‍රාත්තුව ආරම්භ කළ දිනයේ සිට කොන්ත්‍රාත්තුව සම්පූර්ණ වනතෙක් ඇති කාලපරිච්ඡේදයට අදාළ පිරිවැය ගිණුම්වල දැක්විය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අපහරණය කර තිබුණු පිරිවැය රු.10,007,409 ක් වූ වාහන සහ උපකරණ වෙනුවෙන් ලැබිය යුතු මුදල් රු.2,579,026 ක් හා අපහරණ ලාභය රු.2,305,859 ක් මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | වර්ෂය අවසානයේ සිදු කළ භාණ්ඩ අපහරණයන්ට අදාළ මුදල් 2021ජනවාරි සිට මාර්තු දක්වා වරින් වර ලැබී තිබීම නිසා ලැබිය යුතු මුදල නිශ්චිතව හඳුනාගත නොහැකි වූයෙන් එම මුදල් ලැබිය යුතු ලෙස ගිණුම් ගත කිරීමට නොහැකි වුණි.2021 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදිකරන බව දන්වමි. | වත්කම් අපහරණයෙන් ලැබිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් ප්‍රාග්ධනිත කර පරිහරණය කරපෙර වර්ෂයේදී නැවත භාර දී තිබූ පොල් සංවර්ධන මණ්ඩලයට අයත් දුන්කන්නාවත්ත පර්යේෂණ මධ්‍යස්ථානයේ ගොඩනැගිලි පොත්වලින් ඉවත් කිරීමේදී පැන නැගී රු.3,913,777 ක ශුද්ධ හර ශේෂය සමුච්චිත අතිරික්තයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගලපා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකමින් අතිරික්තය අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේ දී මෙවැනි දෝෂ ඇති නොවීමට වග බලාගන්නා බව දන්වමි. | පෙර වර්ෂයට අදාළ ගනුදෙනු සමුච්චිත අතිරික්තයට ගැලපීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැලිගම කොළ මැලවීමේ රෝගය පාලනය කිරීමට දෙමුහුන් බීජ පොල් ලබා ගැනීමේ පැළ තවානක් ස්ථාපිත කිරීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් 2016 වර්ෂයේදී වසර 10 ක කාලයකට බදුගත් වැලිගම ඉඩම සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු නමුත් ගෙවා නොතිබූ රු.1,000,000 ක මූලික ගෙවීම හා රු.25,000 ක් බැගින් වන වාර්ෂික ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම් රු.1,075,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | වැලිගම කොළ මැළවීමේ රෝගය සම්බන්ධ ව්‍යාපෘතිය පොල් වගා කිරීමේ මණ්ඩලය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එක් ව සිදු කරන ලද බැවින් "පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහා මුදල්ගෙවීම" යන වාක්‍ය අවබෝධතා ගිවිසුමෙන් ඉවත් කර සංශෝධනය කිරීමට කටයුතු කර ඇති නිසා 2020 වර්ෂයේ ගිණුම් තුළ ඒ සම්බන්ධ වියදම් හෝ වෙන්කිරීමක් සිදු කර නැත. | 2020 වර්ෂය තුළදී ගිවිසුම සංශෝධනය කර නොමැති හෙයින් බලපැවැත්වෙන ගිවිසුම අනුව බැරකම් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | විවිධ ව්‍යාපෘති සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන ගිණුම්ගත කරනු ලබන ආකාරය පිළිබඳ නිවැරදි ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර ගැනීමකින් තොරව ව්‍යාපෘති 31 ක් සඳහා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.173,256,556 ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර එම මුදල් උපයෝගී කරගෙන අවසන් කර තිබුණු ව්‍යාපෘති 27 ක වියදම රු.111,427,751 ක් මණ්ඩලයේ වියදම් ලෙස සටහන් කර තිබුණ ද, මෙකී වියදමට අදාළ ප්‍රාග්ධන ලැබීම් ප්‍රමාණය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. මෙම නිසා රජයේ ප්‍රාග්ධන දායකත්වය හා සමුච්චිත අතිරික්තය පිළිවෙලින් රු.111,427,751 ක් බැගින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | අවසන් වූ ව්‍යාපෘතිවලට අදාළප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් අඩුනොකළ වියදම් 2021 වර්ෂයේදී ගැලපීමට කටයුතු කරමි. | විවිධ ව්‍යාපෘති සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන ගිණුම්ගත කරනු ලබන ආකාරය පිළිබඳ නිවැරදි ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කරගෙන ගිණුම් ගැලපීම කළ යුතුය. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් තොග සත්‍යාපන වාර්තාවෙහි, පොත් 289 ක ඌනතාවයක් ද, පොත් 190 ක් ගිණුම්ගත වී නොමැති බව ද, පොත් 31 ක් විවිධ ගැටළු හේතුවෙන් සත්‍යාපනය කළ නොහැකි බවට ද තොරතුරු ඇතුළත් වී තිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.3,159,059 ක පොත් අගයෙහි නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සනාථ කළ නොහැකි විය. | පුස්තකාල පොත් භෞතික සත්‍යාපනය සඳහා කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට එම කටයුතු අවසන් අදියරෙහි පවතී. | පුස්තකාල පොත් සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියවැඩි දියුණු කිරීමටත්,භෞතික සත්‍යාපනය අනුව ගිණුම් ගැලපීමටත් කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විදේශ ගමන් ගොස් පැමිණි නිලධාරින් දෙදෙනෙකුට2019 වර්ෂයේ දී ලබාදෙන ලද රු.777,856 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා ගැනීමට කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනෙකුත් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය බොහෝ අවස්ථාවල එකී සංචාරය නිම වූ පසුව ලැබෙන බැවින්රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මත අත්තිකාරමක් වශයෙන් මෙම මුදල් නිකුත් කරනු ලැබුව ද, මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. | නොපමාව අත්තිකාරම පියවිය යුතුය. |
| (ආ) වර්ෂ 1992 – 2014 කාල පරතරය තුළ ශිෂ්‍යත්ව ලබා විදෙස්ගතව නැවත සේවයට නොපැමිණි නිලධාරින් 09 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.28,588,859 ක මුදලක් නිලධාරින්ගෙන් සහ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම් උල්ලංඝනය කළ 07 දෙනෙකුට එරෙහිව පවරා ඇති නඩු විභාග වෙමින් පවතින බව හා දෙදෙනෙකුට එරෙහිව නඩු කටයුතු ආරම්භ කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇතත් කොවිඩ් වසංගතය හේතුවෙන් කටයුතු ආරම්භ වී නොමැත. | ගිවිසුම් උල්ලංඝනය කළ අයගෙන් මණ්ඩලයට මුදල්අය කරගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 1 ට වඩා පැරණි තෙවන පාර්ශවයන් 25 කට ගෙවිය යුතු රු.11,513,887 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | තෙවන පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මු. රෙ.571 | | | |
| | මහා භාණ්ඩාගාරයෙන් ලැබූ සෙස් අරමුදලින් ආයතනය විසින් ක්‍රියාත්මක කළ සෙස් ව්‍යාපෘතිය අවසාන වී සමාලෝචිත වර්ෂය වන විට වසර 13 ක් ගත වී තිබූ නමුත් රු.424,352 ක රඳවාගත් මුදල් | අදාළ රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීම සඳහා එම ආයතනවල වර්තමාන ලිපිනයන් සොයා ගැනීම අසීරුය. එම කොන්ත්‍රාත් කාර්යයන්වල අඩුපාඩු පවතී ද යන්න තහවුරු කර ගෙන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි. | 2021වර්ෂයේ දී ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ii) මු. රෙ.371 | අත්තිකාරම් ලබාගත් කාර්ය අවසන් වූ වහාම එම අත්තිකාරම පියවිය යුතු වුවද, විවිධ පර්යේෂණ ව්‍යාපෘති සහ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා 2018හා 2019 වර්ෂයන්හි පාර්ශව 3 කට ලබාදී තිබූ එකතුව රු.939,558 ක අත්තිකාරම් මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘති 5ක් සඳහා ලබා දී ඇති අත්තිකාරම් එම කටයුතු අවසන් වන අදියරයන් අනුව පියවීම සිදු කරනු ඇත.නිළධාරින් දෙදෙනෙකුගේ විදේශ සංචාරයක් සඳහා ගුවන් ටිකට් පත් මිළ දී ගැනීමට ගෙවන ලද අත්තිකාරම් සඳහා භාණ්ඩාගාරයෙහි අනුමැතිය ලැබී නොමැති වීමෙන් පියවීමට නොහැකි වී ඇත.නළ ළිදක් ඉදි කිරීම සඳහා ලබා දී ඇති අනෙක් අත්තිකාරම එම කාර්යය අසාර්ථක වී ඇති බැවින් වියදමක් ලෙස කපා හැරීමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරිණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් ලබාගත් කාර්ය නිමවූ පසු ඒවා පියවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,639,622 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයරු. 39,691,558 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,051,936ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,708,600 කින් ඉහළ ගිය ද, වියදම රු.25,760,534 කින් ඉහළ යාම මෙම පිරිහීම කෙරෙහිප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසරකට "කප්රුවන" දෙමුහුන් පොල් පැල 250,000 ක් ජාතික පොල් රෝපණයට ලබාදීම අරමුණු කරගෙන රු. 25,814,945 ක රජයේ වියදම් | මෙම භූමියේ කුඩා වැව් 2ක් සහ කැලෑ රොදක් පැවතීම නිසාබීජ පොල් පැළ සිටුවා ඇති අක්කර 141ක් පමණ භූමි ප්‍රමාණයෙහි පැළ 3580ක පුරප්පාඩු පැවති | බීජ උයන පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා රු.40,375,217 ක හලාවත වැවිලි සමාගමේ වියදම් මත එම සමාගමට අයත් හලාවත කීනියම වත්තේ 2013 වසරේදී අක්කර 160 ක බීජ පොල් උයනක් ස්ථාපිත කර තිබූ නමුත්, ශක්‍යතා අධ්‍යනයක් සිදුකර දිගුකාලීන සැලැස්මක් සකස් කර නොතිබීම, පැළ 4,818 ක පුරප්පාඩුව පැවතීම, අත් පරාගණන කටයුතු හා වගාව නිසි පරිදි නඩත්තු නොවීමයනාදී කරුණු හේතුවෙන් මෙම උයන පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන බවට නිරීක්ෂණය නොවීය. | අතර නඩත්තු කටයුතුවල සිදු වූ අඩුලුහුඩුකම් පැළ 4483ක් මියයෑමටප්‍රධාන හේතුව විය.සැන්රාමන්බීජනිෂ්පාදනයතු ළින්මෙම වර්ෂයේ පුරප්පාඩු සිටුවීම අවසාන කිරීමට සැලසුම් කර ඇත.<br>කොළකුන්දිරාශාකයට දැඩිව බලපානරතුකුරුමිණිහානියට202 0වර්ෂයේදී පොල් පර්යේෂණ ආයතනය මගින් නිපදවූ රතු කුරුමිණි විකර්ෂකය මෙම බීජ පොල් උයන තුළයොදා එම හානිය මර්ධනය කිරීමට සැලසුම් කර ඇත.<br>හලාවත වැවිලි සමාගම මගින් බීජ පොල් උයනේ නඩත්තු කටයුතු දැනට හොඳින් සිදුකරන නිසා ඉදිරි කාලයේදී මෙම බීජ පොල් උයනේ ඉතා හොඳ ප්‍රගතියක් පෙන්වීමට හැකිවනු ඇත. | |
| (ආ) | කීනියම බීජ පොල් උයනේඅක්කර 160 ක භූමි ප්‍රමාණයේ සියලුම ශාඛවලට ජලය සැපයීම සඳහා රු.17,501,925 ක් වැයකර නල ජල පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, ජලය එක්රැස් කරන ටැංකියක් සකස් කර නොතිබීම නිසා නල ළිඳ අවට ප්‍රදේශයට පමණක් එමඟින් ජලය සැපයෙන අතර ඉතිරි ප්‍රදේශයට බවුසර් මඟින්ජලය සපයන බවට නිරීක්ෂණය වූයෙන්, එම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ කාර්යභාරය මතභේදාත්මක විය. | ජලය එක්රැස් කරන ටැංකි යොදා ගැනීමටමුලිකව සැලසුම් කර නොතිබුණි. භූගත ළිඳ මගින් මිනිත්තුවකට ජලය ලීටර 200ක් ලබා ගත හැකි බව ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා දී තිබුණු වාර්තාවේ සටහන් කර තිබූ බැවින් ළිඳේ ජලය කෙලින්ම නළ පද්ධතියට යොමු කිරීමට සැලසුම් කළනමුත් වියළි කාලයේදී ළිඳෙන් ජලය විනාඩියකට ලීටර 60-50ක් පමණ ලැබීම මෙලෙස සියලුම පැළ සඳහා ජල සම්පාදනය කළ නොහැකි වීමට බලපෑ ප්‍රධානම හේතුවයි 2021. වර්ෂයේ ප්‍රතිපාදන යොදා ගනිමින් ජලය ගබඩා කිරීම සඳහා ටැංකි සකස් කිරීමට සැලසුම් කර ඇත. | නල ජල පද්ධතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා බැහැර වීම් සඳහා නිසි පිළියම් යෙදිය යුතු අතර ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත හැකි ආකාරයට නිසි සැලසුම්කරණයක් යටතේ කටයුතු කළ යුතු අතර. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොළ මැලවීමේ රෝගයට ප්‍රතිරෝධිතාවයක් පෙන්නුම් කරන දෙමුහුන් බීජ නිෂ්පාදනය කිරීම සඳහා රු. 11,729,698 ක වියදමකින් 2016 වර්ෂයේදී මාතර වැලිගම ප්‍රදේශයේ ස්ථාපනය කරනු ලැබූ අක්කර 05 ක පොල් උයන නිසි අධීක්ෂණයකින් තොරව පවත්වාගෙන යාම, බද්දට ගෙන තිබූ පොල් ගස් 50 ක අත් පරාගණන කටයුතු සිදු නොවීම හා පර්යේෂණ කටයුතු අතර මඟ නතර වීම, රෝගී ගස් ඉවත් කර පවත්වාගෙන යනු ලබන ආරක්ෂණ කලාපයේ සිව්වන අදියරේදී 294 ක් වූ ග්‍රාම නිලධාරි වසම්වලින් වසම් 249 ක් පරීක්ෂා කර නොතිබීම යනාදී කරුණු අනුවදකුණු පළාතේ පැතිර යන පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කිරීම කාර්යක්ෂමව හා ඵලදායීව සිදුවන බවට නිරීක්ෂණය නොවිය. | අත් පරාගණ කටයුතු කළ කම්කරුවාගේ 2020.10.31 දින අවසන් වූකොන්ත්‍රාත් කාලය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් දීර්ඝ කර නොතිබීම නිසා අත් පරාගණ වැඩසටහන නැවතී ඇත. 2020 වර්ෂයේදීආරක්ෂිතකලාපයේහ තරවනඅදියරයටතේග්‍රාමනිල ධාරීවසම් 45 ක්පරීක්ෂාකොටඇත.<br>(පර්යේෂණ කටයුතු අතර මග නතර කිරීමසම්බන්ධයෙන් පිළිතුරු සපයා නොමැත.) | වැලිගම කොළ මැලවීමේ රෝගයපාලනය කිරීමේ අකාර්යක්ෂමතායවන් හඳුනාගෙන ඒවා කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තෙවන පාර්ශවයන් විසින් මණ්ඩලයට විරුද්ධව සේවා ප්‍රශ්න හා මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් නඩු 09 ක් ගොනුකර තිබුණි. | එක් නඩුවක් මේ වන විට අවසන්ව ඇති අතර අනෙකුත් නඩු අධිකරණයේ විභාග වෙමින් පවතී. | මණ්ඩලයේ සියලු කටයුතු නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලව සිදු කළ යුතුය. |
| (ඉ) | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2016 වර්ෂයේදී නතර කර තිබූ ෆාම් ඔයිල් ව්‍යාපෘතිය සඳහා ලබාගෙන තිබූ රු.229,546 ක් වටිනා | මෙම රසායන ද්‍රව්‍ය වෙනත් අංශවල පර්යේෂණ කටයුතු සඳහා ලබා දීමට තීරණය කර ඇත. | ඉතිරි වී ඇති තොග උපයෝජනයට හෝ අපහරණයට පියවර ගත යුතුය. |

රසායනාගාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සතු ජාන සම්පත් මධ්‍යස්ථාන (වතු) 10 හි සමාලෝචිත වර්ෂයේ ගෙඩි 3,941,973 ක් වූ පොල් එලදාව 2019 වර්ෂයේ ගෙඩි 5,410,551 ක් වූ එලදාව සමඟ සැසඳීමේදී සියයට 27 කින් ද, ගෙඩි 5,079,249 ක් වූ ඇස්තමේන්තුගත පොල් එලදාව සමඟ සැසඳීමේදී සියයට 22 කින් ද අඩුවී තිබුණි. එම අඩුවීම ජාන සම්පත් මධ්‍යස්ථාන අතර සියයට 2 ක සිට 40 ක් දක්වා පරාසයක විය. | 2010 සිට 2020දක්වා වර්ෂ 10ක පොල් පර්යේෂණ ආයතනයේ වතුවල පොල් එලදාවේ විචලනය සැලකූ විට එහි සාමානය අගය පොල් ගෙඩි මිලියන 4.5ක් පමණ වේ.<br>වර්ෂාපතනයේ අගය අඩුවීම, හොඳින් පැතිරුණු වර්ෂාපතනයක් නොලැබීමහා වාර්ෂික තෙත් දින ගණන අඩුවීම නිසා 2020වර්ෂයේ දී සමස්ත පොල් එලදාව ඇස්තමේන්තුගත පොල් එලදාව හා සැසඳීමේ අඩුවීමක් වී ඇත. | පොල් එලදාව අඩුවීමට බලපාන සියලුම කරුණු අධ්‍යයනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මණ්ඩලය සතු ජාන සම්පත් මධ්‍යස්ථානවල පොල් එලදාව නිසි කලට ලබා ගැනීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් වැටුනු පොල් ප්‍රමාණය සැලකිය යුතු මට්ටමක පැවති අතර 2018, 2019 හා 2020 වර්ෂයන්හි එම ප්‍රමාණය පිළිවෙලින් ගෙඩි 564,659 ක්, 1,043,374 ක් හා 885,811 ක් වශයෙන් සමස්ත පොල් එලදාවේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 20.2, 19.2 ක් හා 22 ක් වශයෙන් විය. | වාණිජ මට්ටමින් නඩත්තු වන මහා පරිමාණ පොල් වතු කළමනාකරණයේ දී වැටුණු පොල් ප්‍රමාණය සමස්ත පොල් එලදාවෙන්සියයට 20ක් පමණ වීම සාමාන්‍ය අගයක් වේ.<br>වර්ෂයකට පොල් පොල් මුර 08ක් වන පරිදි මාස 1½ - මාස 02ත්අතර කාලපරාසයක් තුළ පොල් එලදාව නෙලීමේ කටයුතු සිදු කරනබැවින් වැටුණු පොල් ප්‍රමාණයේ තරමක වැඩි වීමක් දක්නට ලැබෙනු ඇත. | සමස්ත ගස් ප්‍රමාණයම ආවරණය වන ආකාරයට පොල් එලදාව නිසිකලට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පර්යේෂණ මධ්‍යස්ථාන/ ජාන සම්පත් මධ්‍යස්ථාන 10 හි අඩි 6 කවයට පොහොර යෙදිය යුතු ගස් ගණන 72,844 ක් වුවද, පොහොර යොදා තිබූ ගස් ගණන 56,918 ක් පමණ විය. පොහොර දැමීම නිසි පරිදි සිදු නොවීම පොල් එලදාව අඩුවීම කෙරෙහි බලපාන බවට නිරීක්ෂණය විය. | කෝවිඩ් – 19 වසංගතය නිසා රටතුළ පැවති වාතාවරණය හේතුකොට ගෙන වර්ෂය සඳහා මිලදී ගන්නා ලද පොහොර තොග එක් එක් වත්ත වෙත ලැබීමට තරමක ප්‍රමාදයක් සිදුවූ නමුත්2021 වර්ෂයේ පළමු කාර්තුව තුළ පොහොර යොදා අවසන් කර ඇත . | සාර්ථක පොල් එලදාවක් ලබා ගැනීම පිනිස කටයුතු මනා ආකාරයට කළමනාකරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පොල් පර්යේෂණ මණ්ඩලය මගින් පොල් වගාකිරීමේ මණ්ඩලයට දෙමුහුන් බීජ පොල් ලබාදීම 2014 සිට 2017 වර්ෂයන්හි පිළිවෙලින් ගෙඩි 73,082 ක්, 46,367 ක් 37,234 ක් හා 44,730 ක් විය. එසේ වුවද, 2018, 2019 හා 2020 අතර කාලයේදී ගෙඩි 26,763 ක්, 36,631 ක් හා 39,375 ක් වශයෙන් එය අඩු වී තිබුණි. | එක් එක් වර්ෂයේ වාර්ෂික පොල් ඵලදාවේ සිදුවන විචලනයන් දෙමුහුම් බීජ පොල් ප්‍රමාණයන්ගේ අඩු වැඩි වීමටද බලපානුලබයි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට දෙමුහුන් බීජ පොල් ලබාදීම සම්බන්ධයෙන් නිසි සැලසුම් සහගත වැඩ පිළිවෙලක් සකස් කරගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල් පර්යේෂණ මණ්ඩලයේ 391 ක් වූ ස්ථිර අනුමත කාර්ය මණ්ඩලයෙන් 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 125 ක් හෙවත්සියයට 32 ක් පුරප්පාඩු වී පැවතුණි. ඒ අතර ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම අධ්‍යයන හා පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 69 කින් 42 ක පුරප්පාඩුව ද විය. | අනුමත ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම අධ්‍යයන හා පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 42පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. අභ්‍යන්තර බඳවා ගැනීම් පමණක් සහිත තනතුරු සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නොමැති වීම නිසා බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇතත්මෙතෙක් අනුමැතිය නොලැබීමෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 06 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.51 හා 6.5.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශන සමඟකෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු යුතුය. |

**4.2** **වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි. | COVID වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාද වී ඇති 2019 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ මුද්‍රණ කටයුතු අවසන් වූ වහාම කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත. | නියමිත දින වකවානු ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතුය. |